1 පත්‍රයට අදාළ ගැටළු

11 ශ්‍රේණිය

**5 වන ඒකකය - බහුමාධ්‍ය තාක්ෂණය යොදා ගනිමින් සරල වෙබ් අඩවි නිර්මාණය**

අ.පො.ස. (සා.පෙළ)- 2016

1. පහත දැක්වෙන HTML කේත බණ්ඩය සලකන්න.

```
<html>
<body>
<dl>
        <dt> Government Schools in Sri Lanka</dt>
        <dd> National Schools - 350 </dd>
        <dd> Provincial Schools - 9662 </dd>
</dl>
</body>
</html>
```

ඉහත HTML කේතයෙහි ප්‍රතිදානය වන්නේ

(1) Government Schools in Sri Lanka
National Schools - 350
Provincial Schools - 9662

(2) Government Schools in Sri Lanka
i. National Schools - 350
ii. Provincial Schools - 9662

(3) Government Schools in Sri Lanka
- National Schools - 350
- Provincial Schools - 9662

(4) Government Schools in Sri Lanka
1. National Schools - 350
2. Provincial Schools- 9662

2. පහත දැක්වෙන මෘදුකාංග සලකන්න :

A - සරල පාඨ සංස්කාරක (Simple text editor)
B - වදන් සැකසුම් මෘදුකාංග (Word-processing software)
C - වෙබ් සංස්කාරක මෘදුකාංග (Web authoring software)

ඉහත දැක්වෙන කුමන මෘදුකාංගය/ මෘදුකාංග HTML ලේඛණයක් නිර්මාණය කිරීමට භාවිත කළ හැකි ද?

(1) C පමණි (2) A හා C පමණි (3) B හා C පමණි (4) A, B හා C සියල්ල ම

3. වෙබ් අඩවියක් නැංවීම (Hosting) සඳහා අත්‍යවශ්‍ය **නොවන්නේ** පහත සඳහන් කවරක් ද?

(1) වෙබ් අතරික්සුව (Browser) (2) වෙබ් සේවාදායකය (Server)
(3) IP ලිපිනය (4) වෙබ් අඩවියෙහි අන්තර්ගතය (Content)

අ.පො.ස. (සා.පෙළ)- 2017

4. මඳ වේගී අන්තර්ජාල සම්බන්ධතාවයක් හේතුවෙන් පරිශීලකයකුට රූපයක් (image) දැක ගත නොහැකි වන අවස්ථාවක දී ආදේශක තොරතුරක් ලබා දිය හැකි වන්නේ HTML හි ඇති පහත සඳහන් කුමක් භාවිතයෙන් ද?
(1) src (2) href (3) alt (4) img

5. http://www.moe.gov.lk වෙත “Ministry of Education” අධිසන්ධානය (hyperlink) තනා ගැනීම සඳහා නිවැරදි HTML කේතය කුමක් ද?

(1) <a>http://www.moe.gov.lk</a>
(2) <a href=”http://www.moe.gov.lk”> Ministry of Education</a>
(3) <a name=”http://www.moe.gov.lk”> Ministry of Education</a>
(4) <a url=”http://www.moe.gov.lk”> Ministry of Education</a>

6. HTML භාවිතයෙන් අංකිත ලැයිස්තුවක් (numbered list) ලබා ගැනීම සඳහා කවර HTML උසුලනය (tag) භාවිත කළ හැකි ද?

(1) <ul> (2) <dl> (3) <ol> (4) <list>

අ.පො.ස. (සා.පෙළ)- 2018

7. අනුරූපයක් (image) ඇතුල් කිරීම සඳහා වන නිවැරදි HTML වගන්තිය වන්නේ කුමක් ද?

(1) <img src= “image.gif” alt= “MyImage”>
(2) <img href= “image.gif” alt= “MyImage”>
(3) <image src= “image.gif” alt=”MyImage”>
(4) <img alt= “MyImage”>image.gif</img>

අ.පො.ස. (සා.පෙළ) - 2019

8. වෙබ් අතරික්සුවක් මගින් විදැහු (render) කළ පහත ලැයිස්තුව සලකන්න.

- Science
- Maths
- English

ඉහත ලැයිස්තුව නිර්මාණය කිරීමට අවශ්‍ය වන HTML උසුලන මොනවා ද?

(1) <dl>, <dt> (2) <dl>, <li> (3) <ol>, <li> (4) <ul>, <li>

9. වෙබ් පිටු සංවර්ධනය සම්බන්ධයෙන් නිවැරදි වන්නේ පහත සඳහන් කුමන වගන්ති ද?

A - ගතික වෙබ් පිටුවලින් (dynamic web pages) පෙන්වන සන්ධාරය (content) පරිශීලක ආදාන අනුව හෝ කාලය අනුව හෝ වෙනස් විය හැකිය.
B - ගතික වෙබ් පිටු නිපදවීමට HTML පමණක් භාවිත වේ.
C - වෙබ් පිටු නිර්මාණය සඳහා වෙබ් කර්තෘ මෙවලම් (web authoring tools) භාවිත කළ හැකි ය.

(1) A හා B පමණි (2) A හා C පමණි (3) B හා C පමණි (4) A, B හා C සියල්ලම

10. පහත සඳහන් කවර උසුලන (tags) HTML අක්ෂර (character) හැඩසව් කිරීම සඳහා භාවිත කළ හැකි ද?

(1) <i>, <b>, <u> <em> (2) <br> ,<b>, <u>, <p>
(3) <p>, <li>, <u> ,<em> (4) <i>, <b>, <li>, <em>

අ.පො.ස. (සා.පෙළ) - 2020

11. HTML සම්බන්ධයෙන් **අසත්‍ය** වන්නේ පහත සඳහන් කුමන වගන්තිය ද?

(1) HTML යනුවෙන් කියැවෙන්නේ Hypertext Markup Language යන්නයි.
(2) HTML භාවිතයෙන් වෙබ් පිටු නිර්මාණය කළ හැකි ය.
(3) HTML උසුලන, වෙබ් අතරික්සුව තුළින් වෙබ් පිටු ප්‍රදර්ශනය කළ හැකි ආකාරය කෙසේද යන්න තීරණය කරයි.
(4) HTML ලේඛන නිර්මාණය කරනු ලබන්නේ වෙබ් අතරික්සුවක් භාවිතයෙනි.

12. අංකිත ලැයිස්තුවක් (numbered list) සාදා ගැනීමට පහත දක්වා ඇති කුමන HTML උසුලන යුගලය භාවිත කළ යුතු වන්නේ ද?

(1) ul, li (2) dl, dd (3) nl, li (4) ol, li

13. දී ඇති වගුව සැකසීමට පහත දක්වා ඇති කුමන HTML උසුලන හා පරාමිති (tags and parameters) භාවිත කළ හැකි වන්නේ ද?

| Name | Tel. Number |
|---|---|
| Premachandra | 019-2220001 |
| | 075 - 2233441 |
| Sivaraj | 018-6722117 |
| | 076-4123789 |

(1) Table, tr, th සහ rowspan=2 වූ td
(2) Table, tr, th සහ colspan=2 වූ td
(3) Table, th, td සහ rowspan=2 වූ tr
(4) Table, td, tr සහ colspan=2 වූ th

අ.පො.ස. (සා.පෙළ) – 2021

14. වෙබ් පිටුවක නිවැරදි HTML උසුලන අනුක්‍රමය (tag sequence) වන්නේ පහත සඳහන් ඒවායින් කුමක් ද?

(1) HTML, Body, Title, Head
(2) HTML, Head, Title, Body
(3) HTML, Title, Head, Body
(3) Head, Title, HTML, Body

15. පහත සඳහන් කුමන වගන්ති නිවැරදි වන්නේ ද?

A - HTML උසුලන මගින් වෙබ් අතරික්සුව තුළ දී වෙබ් පිටු දිස්වන අයුරු නිර්ණය කරයි.
B - ලෝක විසිරි වියමනේදී (WWW) වෙබ් පිටුවක් අනන්‍යව හඳුනාගනු ලබන්නේ URL මගිනි.
C - අධි සන්ධාන (hyperlinks), ලෝක විසිරි වියමනේදී වෙබ් පිටු සම්බන්ධ කිරීමට ඉඩ ලබා දේ.

(1) A සහ B පමණි (2) A සහ C පමණි (3) B සහ C පමණි (4) A, B සහ C සියල්ලම

16. http://www.gov.lk නමැති URL එක සහිත ශ්‍රී ලංකා රජයේ නිල වෙබ් ද්වාරයට (portal) අධි සන්ධානයක් නිර්මාණය කිරීමට යොදාගත හැකි නිවැරදි HTML වගන්තිය කුමක් ද?

(1) <a href=“http://www.gov.lk”>Government of Sri Lanka Web Portal</a>
(2) <a >“http://www.gov.lk”</a>>Government of Sri Lanka Web Portal
(3) <a> src=“http://www.gov.lk”</a>Government of Sri Lanka Web Portal
(4) <a url=“http://www.gov.lk”>Government of Sri Lanka Web Portal</a>

17. වගුවක් නිර්මාණය කිරීම සඳහා පහත සඳහන් HTML වගන්ති සලකා බලන්න.

```
<html>
<body>
<table border=2>
<tr> <th> Company Name </th> Contact Number </th> </tr>
<tr> <td rowspan=2> ABC Ltd </td> <td> 011-2222222 </td> </tr>
<tr> <td> 011-9999999 </td> </tr>
<tr> <td> XYZ & Sons </td> <td> 011-7777777 </td> </tr>
</table>
</body>
</html>
```

ඉහත වගන්ති මගින් නිර්මාණය වූ නිවැරදි වගුව කුමක් ද?

(1)

| Company Name | Contact Number |
|---|---|
| ABC Ltd | 011-2222222 |
| | 011-9999999 |
| XYZ & Sons | 011-7777777 |

(2)

| Company Name | Contact Number |
|---|---|
| ABC Ltd | 011-2222222 |
| XYZ & Sons | 011-7777777 |
| | 011-9999999 |

(3)

| Company Name | ABC Ltd | XYZ & Sons |
|---|---|---|
| Contact Number | 011-2222222 | 011-7777777 |
| | | 011-9999999 |

(4)

| Company Name | ABC Ltd | XYZ & Sons |
|---|---|---|
| Contact Number | 011-2222222 | 011-7777777 |
| | 011-9999999 | |

අ.පො.ස. (සා.පෙළ) – 2022

18. පහත කවර HTML වගන්තියක් කාරක රීතිවලට (syntax) **පටහැනි ද?**
(1) <a href="http://www.railway.gov.lk">Sri Lanka Railways </a>
(2) <h2><center><font face="Arial" color="blue">WORK</font></center></h2>
(3) <img http://www.w3schools.com/images/picture.jpg border = "3">
(4) <p align="right"> Sri Lanka </p>

**පිළිතුරු**

| | | | | | |
|---|---|---|---|---|---|
| (1) 1 | (2) 4 | (3) 1 | (4) 3 | (5) 2 | (6) 3 |
| (7) 1 | (8) 4 | (9) 2 | (10) 1 | (11) 4 | (12) 4 |
| (13) 1 | (14) 2 | (15) 4 | (16) 1 | (17) 1 | (18) 3 |